# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
## தகவல் அறியும் உரிமைகளுக்கான ஆணைக்குழு
## RIGHT TO INFORMATION COMMISSION
**(CONSTITUTED UNDER THE ACT, No 12 OF 2016)**

කාමර අංක 203-204 ,බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත කොළඹ 07
அறை இல 203-204, பிஎம்ஐசிஎச் ,பௌத்தாலோக்க மாவத்தை , கொழும்பு 07.
Room No 203-204, BMICH, Bauddhaloka Mawatha, Colombo 07


මගේ අංකය / எனது / My No } RTIC/AD/MA1/03/01/2025

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2025.12.08

අධ්‍යක්ෂක
ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
විද්‍යා මාවත, කොළඹ-7

**ආපදා සහන සැලසීමට අදාල තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කිරීම**

2017 පෙබරවාරි 03 දින හා අංක 2004/66 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් පලකර ඇති 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද පනතේ 2017 නියෝග මාලාවේ අංක 20 දරණ නියෝගයේ V වන කොටසේ සදහන් වන්නේ "මහජන සේවා තොරතුරු - පොදු මහජනතාවට ලබා දෙන ලද සේවාවන්, ඊට අදාළව නිකුත් කර ඇති උපදෙස්, පොත්, පත්‍රිකා, ආකෘති පත්‍ර, ගාස්තු හා ඒවාට අදාළ කාල පරාසයන්" සෑම පොදු අධිකාරියක්ම සිය නිල වෙබ් අඩවියේ පලකළ යුතු බවයි'

අයහපත් කාළගුණ තත්වය හේතුවෙන් විපතට පත් වූ පුද්ගලයන්ට ලබාදෙන සහන සම්බන්ධව චක්‍රලේඛණ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අතර ඒ අනුව සහන ඉල්ලා සිටීමට අදාලව ඔබ ආයතනය මගින් අයදුම්පත්‍ර නිකුත් කර ඇති අතර එම අයදුම්පත්‍ර ඔබගේ නිල වෙබ් අඩවියේ පළකර නොමැත.

එබැවින් එම තොරතුරු හැකි ඉක්මනින් සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා වලින් නිල වෙබ් අඩවිය තුල පළ කරන ලෙසත් අදාල සහන සැලසීම් කටයුතු පිළිබදව සියලු අයදුම්පත්‍ර සහ මාර්ගෝපදේශ උපදෙස් ආදියද වෙබ් අඩවිය තුල පළකරන ලෙසත් ඔබ වෙත දැනුම්දීමට කොමිෂන් සභාව තීරණය කර තිබේ'

මෙම දැනුම්දීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 14 (අ) සහ 14(ආ) වගන්ති සමග කියවිය යුතු 15(ඇ) වගන්තිය මගින් කොමිෂන් සභාව වෙත ලැබී ඇති බලතල අනුව සිදුකරන ලද දැනුම්දීමක් බව කාරුණිකව සලකන්න' අදාළ පනතේ හා ගැසට් පත්‍රයේ පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග යොමු කරමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි

……………………………
අධ්‍යක්ෂක ජනරාල්

පිටපත : 1. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

2. අතිරේක ලේකම්, ආපදා කළමනාකරණ, ආරක්ෂක අමාත්‍යාංශය


Chairman } 011 2691625(Tel)
Director General } 0112691007(Tel) dg@rtic.gov.lk
Senior Research Officer } 0112678981 (Tel) sro@rtic.gov.lk
Admin Branch } 0112691625 (Tel/Fax) admin@rtic.gov.lk
Reserch Branch } 0112687950(Tel) research@rtic.gov.lk

For More Information : http://www.rticommission.lk
E-Mail : info@rtic.gov.lk
Legal Branch } 0112691628 (Tel) lo@rtic.gov.lk
Finance Branch } 0112687849(Tel)/0112687846(Fax) finance@rtic.gov.lk/rticfinance@sltnet.lk
Appeal Branch } 0112678980 (Tel) appeal@rtic.gov.lk